**කල්මුනෙයි මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ඔක්තෝබර් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින මහ නගර සභාවේ කොමසාරිස්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කල්මුනෙයි මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෝටර් රථ 32 ක් සඳහා තක්සේරු කළ වටිනාකම එකතුව රු.43,080,000 ක් වී තිබුණි. එසේ වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.11,152,013 ක් වශයෙන් දක්වා තිබූ බැවින් ස්ථාවර වත්කම් සහ සමුච්චිත අරමුදල් රු.31,927,987 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලෙජර ගිණුම අනුව 2016 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ශේෂය රු.40,259,540 ක්ව තිබුණත්, 2017 ජනවාරි 01 දින එම ශේෂය රු.38,932,934 ක් වශයෙන් ඉදිරියට ගෙන ඒමෙන් මූල්‍ය ප්‍රකාශනවල මෙම ශේෂය රු.1,326,606 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ලබාගෙන තිබූ ශේෂ සනාථ කිරීමේ ලිපිය ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කාරෙයිතිවු ප්‍රාදේශීය සභාවට 2016 දෙසැම්බර් 31 දිනට මහ නගර සභාව විසින් ගෙවිය යුතු ගාස්තු රු.2,854,802 ක්ව පැවතියද, එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) "නැණසල" වැඩසටහන යටතේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ පරිගනක 04 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 වර්ෂයේ සිට හිඟහිටව පැවත එන පොදු වෙළඳපොල බදු කුලී රු.12,314,393ක්, මස් කඩ බදු කුලී රු.7,661,912 ක්, කඩකුලී රු.13,657,443 ක් ආදිය අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි.

(ආ) 1996 වර්ෂයේ සිට හිඟ හිටව පැවැත එන ත්‍රිරෝද රථ හා වාහන ආරක්ෂක බදු රු.3,394,613 ක් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි.

### 1.3.4 ලේඛනගත සාක්ෂි නොවීම්

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| පොදු වෙළඳපොල හිඟ බදු කුලී | 12,314,393 | හිඟ බදුකුලී ලේඛනය |
| තැන්පත් ගිණුම් ශේෂ | 31,742,610 | තැන්පතු සැසඳීම් ප්‍රකාශය සහ කාල විශ්ලේෂණය |

### 1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විශ්ලේෂණය කර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහ නගර සභා ආඥා පනතේ 252 වන පරිච්ඡේදය 218 වගන්තිය | පරිපාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සකස් කළ යුතු විස්තරාත්මක වාර්තාව 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ප්‍රකාරව විනාශ කළ යුතු පුස්තකාල පොත් 1,294 ක්, විකිණිය යුතු තොග අයිතමයන් 595 ක් සම්බන්ධයෙන් 2018 ඔක්තෝබර් 19 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය | එක් එක් පළාත් සභාව විසින් නගර සංවර්ධනය නමින් වූ බැංකු ගිණුමක් ආරම්භ කර එම ගිණුමට සේවා ගාස්තු සහ දඩ ගාස්තු තැන්පත් කළ යුතු බවට දැනුවත් කර තිබුණත් මහනගර සභාව විසින් එවැනි නගර සංවර්ධනය නමින් වූ බැංකු ගිණුමක් ආරම්භ කර ක්‍රියාවට නංවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,431,998 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,251,122ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,819,124ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්**

-----------------------------------------------------------

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම්, බිල්කළ ආදායම් සහ හිඟ ආදායම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | රැස් කළ ආදායම් | බිල්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | රැස් කළ ආදායම් | බිල්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 11,100 | 12,174 | 11,592 | 91,567 | 11,100 | 15,280 | 18,309 | 90,985 |
| (ii) | කුලී | 19,980 | 16,637 | 15,621 | 38,792 | 21,410 | 15,530 | 14,840 | 36,505 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 9,705 | 7,254 | 7,254 | - | 6,885 | 8,735 | 8,735 | - |
| (iv) | අනෙකුත් ආදායම් | 43,255 | 24,295 | 24,295 | - | 34,481 | 36,715 | 36,715 | - |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකරගත යුතු රු.189,121,226 ක ආදායමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.58,762,245 ක් අයකරගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 31 ක්ව පැවතුණි.

### 2.2.3 වරිපනම් බදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මහානගර සභාව විසින් වරිපනම් බදු අයකිරීමේ නිවේදන පදිංචිකරුවන්ට නිකුත් කර නොතිබුණු අතර වරිපනම් බදු ලේඛනය ද පවත්වා නොතිබුණි.

(ආ) වරිපනම් බද්ද අයකිරීම සඳහා පත්කර තිබූ සේවකයින් 08 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2.5 ක් වැටුප් වශයෙන් ගෙවා තිබූ නමුත්, ඔවුන් විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකර ගත යුතු රු.මිලියන 102.1 ක වරිපනම් බදුවලින් සියයට 10 ක් හෙවත් රු.මිලියන 10.5 ක් පමණක් අයකර ගෙන තිබුණි. තවද, වර්ෂ දෙකකට අධික කාලයක් වරිපනම් බදු ගෙවීම පැහැර හරිනු ලැබූ දේපල හිමියන්ට එරෙහිව මහ නගර සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.4 වෙළඳපොළ කඩකුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහ නගර සභාවට අයත් පොදු වෙළඳපොළේ කඩ කාමර 503 කින් කඩ කාමර 64 ක් කුලියට ලබාගත් අයගෙන් හිඟ කඩකුලී රු.5,130,143 ක් වර්ෂ 07 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ආ) මෙම වෙළඳපොළට යාබදව පිහිටි පුද්ගලික කඩ කාමර අවමය මාසික රු.10,000 සිට රු.20,000 ක් අතර පරාසයකින් කුලියට දී තිබුණි. එසේ වුවත්, මහ නගර සභාවට අයත් මෙම කඩ කාමර සඳහා නව මිල ගණන් ඉදිරිපත් නොකර 1980 වර්ෂයේ සිට මාසික රු.300 සිට රු.2,500 දක්වා පරාසයකින් කුලියට ලබාදෙමින් තිබූ හෙයින් සභාව ආසන්න වශයෙන් රු.මිලියන 60 ක් වාර්ෂිකව අහිමි කරමින් පැවතුණි.

(ඇ) මහ නගර සභාව විසින් එකමුතු චතුරස්‍රයේ පිහිටි කඩ කාමර 24 කින් කඩ කාමර 18ක් සමාලෝචිත වර්ෂයේදී රු.1,614,000 ක කුලියකට ලබා දී තිබුණත්, 2018 ඔක්තෝබර් 18 දින වන විටත් එම වටිනාකමින් රු.1,272,500 ක් අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මහනගර සභාවේ JCB යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු කුලී ගාස්තු රු.76,500 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

### 2.2.5 වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම

සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාරික ආයතන 2,778 කින් රු.9,000,000 ක් වෙළඳ බලපත්‍ර ගාස්තු ලෙස අයකිරීමට ඇස්තමේන්තු කර තිබුණත්, 2018 ඔක්තෝබර් 18 දින වන විට ව්‍යාපාරික ආයතන 1501 කින් රු.6,918,625 ක් පමණක් අයකර ගෙන තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාරික ආයතන 1,277 කට එරෙහිව සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහනගර සභාවේ ගිනි නිවීමේ හමුදා ඒකකයේ ආරක්ෂිත උපකරණ, ගිනි නිවීමේ මෙවලම් සහ ජල නල සවිකිරීම් ආදිය වර්ෂයකට අධික කාලයක සිට අලුත්වැඩියා කර නොතිබූ බැවින් ජනතාවට අවශ්‍ය අවස්ථාවලදී සේවාවන් සැපයීමට නොහැකි තත්ත්වයක් දක්නට ලැබුණි.

(ආ) මහනගර සභාවේ නිලධාරීන් සහ සේවකයන් 243 දෙනෙකු රාජකාරී කටයුතු සිදු කළද, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන් 05 දෙනෙකු හා සේවකයින් 150 දෙනෙකු ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කරමින් කාර්යාලයට පැමිණීම සහ පිටවීම 2018 ඔක්තෝබර් 18 දින දක්වා තහවුරු කර නොතිබුණි.

(ඇ) මහනගර සභාවේ භාවිතා කරනු ලබන මෝටර් රථ සහයන්ත්‍ර 79 කින් මෝටර් රථ සහ යන්ත්‍ර38 කඅයිතියසභාවේ නමට මාරු කර නොතිබුණි. තවද, මෝටර් රථ 25 ක් සහ යන්ත්‍ර භාවිතා කළ නොහැකි තත්ත්වයේ තිබූ අතර, සභාව විසින් ඒවා වෙන්දේසියේ විකිණීමට හෝ විනාශ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය සහ සේවය හැර ගිය සේවකයන් 04 දෙනෙකුගේ හිඟණය ශේෂ රු.169,545 ක් වර්ෂ 02 සිට වර්ෂ 10 කට අධික කාලයක් දක්වා අයකරගෙන නොතිබුණි. මෙම හිඟණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ 2018 ඔක්තෝබර් 18 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
---------------------------------

3.2.1 පුස්තකාල ක්‍රියාකාරකම්
------------------------------

මහ නගර සභාව යටතේ කල්මුනෙයි, සායින්දමරුදු, මරුදමුනෙයි සහ නට්පිට්ටිමුනෙයි ආදී ස්ථානවල ක්‍රියාත්මක වන මහජන පුස්තකාල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 සහ 2016 වර්ෂවලදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින්පෙන්වා දුන් අතුරුදහන් වූ පුස්තකාල පොත් 8,102 ක් සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

(ආ) කල්මුනෙයි මහජන පුස්තකාලයේ අලුත්වැඩියා කටයුතු වර්ෂයකට අධික කාලයක සිට නිම කර නොතිබූ බැවින් පුස්තකාලයේ බැහැර දීම් අංශයේ තිබෙන පොත් පෝර උරවලට අසුරා ගබඩාගත කර පාඨකයින්ගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නොහැකි තත්ත්වයක තිබූ අතර ළමා අංශයත් වසා දමා තිබූ බව නිරීක්ෂණය විය.

3.3 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහනගර සභා බල ප්‍රදේශය තුළ පවතින කානු පවිත්‍ර කිරීම සඳහා ස්ථිර සේවකයින් 22 දෙනෙකුත්, අනියම් පදනමින් සේවකයින් 28 දෙනෙකුත් වශයෙන් පිරිසිදු කරන්නන් 50

දෙනෙකු අනුයුක්ත කර තිබූ නමුත් ස්ථිර සේවකයින් 20 දෙනෙකුත්, අනියම් සේවකයින් 07 දෙනෙකුත් අදාළ කානු පවිත්‍රකිරීමේ කාර්යයන්වල නොයොදවා මහනගර සභාවේ කාර්යාලය සහ පුස්තකාල අංශවල අනුයුක්ත කර තිබුණි.

(ආ) මහනගර සභා බල ප්‍රදේශය තුළ කසල එකතු කිරීම සඳහා ස්ථිර සේවකයින් 57 දෙනෙකු අනුයුක්ත කර තිබූ නමුත්, සේවකයින් 14 දෙනෙකු කාර්යාලය සහ අනෙකුත් අංශවල රාජකාරී කටයුතුවල නිරතව සිටියදී අනියම් සේවකයින් 20 දෙනෙකු ද බඳවා ගෙන තිබුණි.

**3.4 නිරවුල් නොකළ විගණන ඡේද**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බැංකුව විසින් ප්‍රතික්ෂේප කළ චෙක්පත්**

**-----------------------------------------**

මස් කඩ බදු කුලී ඇප මුදල් එකතුව රු.544,154 ක චෙක්පත් 06 ක් 2012 වර්ෂයේදී බැංකුවේ තැන්පත් කළ පසු බැංකුව විසින් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණ ද මේ සඳහා වගකිව යුතු නිලධාරියා මේ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණද ඔහුට එරෙහිව කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ආ) කාර්යාලයේ පිහිටීම දක්වන නාම පුවරුව**

**----------------------------------------------**

කාර්යාලයේ පිහිටීම දැක්වෙන ලීයෙන් තැනූ නාම පුවරු සකස් කර සවිකිරීම සඳහා 2013 වර්ෂයේදී රු.123,000 ක් ගෙවීම් කර තිබූ නමුත්, 2018 ඔක්තෝබර් 18 දින වන විටත් අදාළ පුවරු සවිකර නොතිබුණි.

**(ඇ) පළාත් සභාවට සලසා තිබූ සංවර්ධන ආධාර**

**--------------------------------------------------**

සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවට වෙන් කරනු ලැබූ සංවර්ධන ආධාර යටතේ 2009 වර්ෂයේ සලසා දී තිබූ ප්‍රතිපාදනයන් අදාළ අරමුණු සඳහා උපයෝජනය නොකර රු.මිලියන 3 ක් ස්ථාවර තැන්පතුවලද රු.2,468,590 ක් ජංගම ගිණුම්වල ද තැන්පත් කර තිබුණි.

**(ඇ) ජංගම දුරකථන භාවිතා කිරීමේ ගාස්තු**

**--------------------------------------**

මහ නගර සභාවේ හිටපු නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද මාස 03 කට අදාල ජංගම දුරකථන බිල්පත් රු.13,011 ක් සඳහා 2015 වර්ෂයේදී දෙවරක් ගෙවීම් කර තිබූ නමුත් මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියාට එරෙහිව මේ දක්වා විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ඉ) පාසල් උපකරණ මිලදී ගැනීම**

**----------------------------------**

මහ නගර සභා අරමුදල් උපයෝගී කරමින් රු.124,969 ක මුදලකට ශිෂ්‍යයින් සඳහා ඉගෙනීමට අවශ්‍ය උපකරණ තොගයක් මිලදී ගෙන 2015 ජුනි 30 දින කල්මුනෙයි අල්-අමීන් පාසලට භාරදුන් බව දන්වා තිබුණද, එම විදුහලේ විදුහල්පතිවරයාගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශය අනුව එකී භාණ්ඩ 2017 සැප්තැම්බර් 25 දින වන විටත් එම විදුහලට ලබා දී නොතිබුණි.

(ඊ) **මරුදමුනෙයි මහජන පුස්තකාලයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම**

---

නගර සැලසුම් සහ ජල සම්පත් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදවලින් මරුදමුනෙයි මහජන පුස්තකාල ගොඩනැගිල්ල තවදුරටත් ව්‍යාප්ත කර ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා 2016 නොවැම්බර් 08 දින රු.13,131,163 ක වටිනාකමට කොන්ත්‍රාත් ලබාදීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කර තිබුණි.

(i) මෙම ශ්‍රවනාණාරයට තීන්ත ආලේප කිරීම සඳහා පළාත් ගොඩනැගිලි උපලේඛන රේට (BSR) ප්‍රකාරව එක් වර්ග මීටරයක් සඳහා රු.279 ක් බැගින් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වුවත් ඉංජිනේරුවරයා විසින් එක් වර්ග මීටරයක් සඳහා රු.1,165 බැගින් ඇස්තමේන්තු පිළියෙල කර තිබූ බැවින් මෙම කර්මාන්තය වෙනුවෙන් රු.930,605 ක අධි ඇස්තමේන්තුවක් මත කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් වායුසමීකරණ යන්ත්‍ර (Air Conditioner) 14 ක්, එකක් රු.204,600 ක් බැඟින් රු.2,864,400 ක මිලකට 2016 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, විගණනයට ඉදිරිපත් වූ ලිඛිතව ප්‍රකාශය පරිදි එම වර්ගයේම එම වෙළඳ ලකුණ යටතේ වූ වායු සමීකරණ යන්ත්‍ර එකක් රු.114,900 ක් බැඟින් වූ මිලකට සපයා සවිකිරීමට කල්මුනෙයි Abans ප්‍රදර්ශනාගාරය විසින් එකඟ වී තිබුණි. මේ අනුව කොන්ත්‍රාත්කරුට රු.1,255,800 ක මුදලක් වැඩියෙන් ගෙවීම් කිරීමට සිදුවී තිබුණි.

(උ) **අපජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය**

---

කල්මුනෙයි ඉස්ලාමාත් සුනාමි නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතියේ අපජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ රු.4,380,000 ක වියදමකින් නිම කර තාක්ෂණික නිලධාරියාගේ නිර්දේශ සහ ඉංජිනේරුවරයාගේ සහතික කිරීම් මත සියලුම ගෙවීම් හා ඇප මුදල්ද ගෙවීම් කර තිබුණි. එසේ වුවත්, ප්‍රමාණ පත්‍රවල ඇතුළත් කර තිබූ රු.903,520 ක් වටිනා කාර්යයන් 09 ක් කොන්ත්‍රාත්කරු විසින් නිම කර නොතිබූ නමුත් එම කාර්යයන් ඉටු කළ බවට සහතික කර ගෙවීම් සිදුකර තිබීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) **කල්මුනයි සංචාරක තොරතුරු කේන්ද්‍රය ඉදිකිරීම**

---

සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ කල්මුනෙයි සංචාරක තොරතුරු කේන්ද්‍රය ඉදිකිරීමේ කටයුතු 2017 අප්‍රේල් 04 දින සම්පූර්ණ කර ඇති බව තාක්ෂණික නිලධාරී විසින් නිර්දේශ කිරීමෙන් රු. 2,593,013 ක් ගෙවා තිබුණි. එසේ වුවත්, රු.333,000 ක් වටිනා කාර්යයන් 04 ක් නිමකර නොතිබීම හේතුවෙන් මේ දක්වා මහජන භාවිතය සඳහා විවෘත කළ නොහැකිව නිෂ්කාර්යව පැවැතුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 06 ක් ඉකුත් වීමෙන් පසුව 2018 ඔක්තෝබර් 12 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල මූලික අංගයන්ගෙන් එකක් වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම.<br>(ii) ඝන අපද්‍රව්‍ය සේවා ගාස්තු අයකර ගැනීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු ස්ථාන සඳහා මානව සම්පත් නිසි ලෙස බෙදාහැරීම. |